ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 118/ News/ 2011

ක්‍රි. ව. 2011 ඔක්තෝබර් 24 සඳුදා
04 වෙළුම - 01 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය

## ලෝක ධර්මදූත ඉරුදින



ඔක්තෝබර් 23 වැනිදා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# සැමවිට සැමතැන වන්න ධර්මදූතයෙක්

## ආදරණීය දුවේ පුතේ...

මේ ගෙවී යන්නෙ ලෝක ධර්මදූත ඉරුදිනයි. පසුගිය දින කිහිපය තුළම අප දේවස්ථාන පරිසරය තුළ මේ ලෝක ධර්මදූත ඉරුදින පිළිබඳව කථා කරන්නට යෙදුනා. ඒ පිළිබඳව විශාල දැන්වීම් පත්‍රිකා සියළු දේවස්ථාන දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරන්නට යෙදුනා. මේ ලෝක ධර්මදූත ඉරුදින ඉතාමත්ම වැදගත් දිනයක් වන්නේ ඇයි ? අපි මේ පිළිබඳව මඳක් විමසා බලමු.

ආදර දුවේ පුතේ, ප්‍රසාද ස්නාපනය ලැබූ සැම කිතුනුවෙක්ම ජීවිතයේ උතුම් කැඳවීම් වලට නිරන්තරයෙන්ම අවනත වන්නට ඕනා. කැඳවීම් විවිධ වුවත් පොදුවේ කිතුනු සැමටම තිබෙන උතුම්ම ආරාධනාවක් තමයි ධර්මදූතවරයෙක් වන්නට කරන ආරාධනාව. බලන්න ශුද්ධවූ සුවිශේෂයේ සඳහන් වන මේ උතුම් කැඳවීම පිළිබඳ සඳහන් වගන්තිය. ශුද්ධවූ ජුවාම් තුමාගේ සුවිශේෂයේ 20 වන පරිච්ජේදයේ 21 වන වගන්තිය පැහැදිලිව පෙන්නුම් කරනවා. ජේසුස් වහන්සේගේ ප්‍රකාශනය තුළින් කෙලෙසද ඔවුන් වහන්සේ මේ ධර්මදූත මෙහෙවර තමන් වහන්සේගේ අනුගාමිකයන්ට පැවරුවේ කියලා.

"පියාණන් වහන්සේ මා එවා වදළාක් මෙන් මම ද ඔබව යවමි." ඔවුන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ට නිරන්තරයෙන්ම පැවසුවේ මේ උතුම් කාර්යයභාරයේ තිබෙන වැදගත්කමයි. ශුද්ධවූ මතෙව් තුමාගේ සුවිශේෂයේ 28 වන පරිච්ජේදයේ 19 හා 20 වගන්ති මෙම උතුම් කැඳවීම ජේසුස් වහන්සේගේ වචනයෙන් විස්තර කරන්නේ මෙහෙමයි. "ඔබ ගොස් සකල ජාතීන් මාගේ ගෝලයන් කරන්න.... මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්නට ඔවුන්ට උගන්වන්න."

ආදර දුවේ පුතේ, ශුද්ධවූ පේදුරුතුමාගේ නායකත්වය තුළ ආරම්භ කළ ශුද්ධවූ සභාවේ සම්පූර්ණ ක්‍රියාවලිය රඳා පවතින්නේ මේ ධර්මදූත මෙහෙවර මතයි. සැබවින්ම ශුද්ධවූ සභාව පවතින්නේ ශුභාරංචිය පතල කිරීමටයි. මුලින්ම සඳහන් කළ පරිදි ශුද්ධවූ ප්‍රසාද ස්නාපනය ලැබූ සැම කිතුනුවෙක් තුළින්ම මෙම ධර්මදූත ක්‍රියාවලිය ජීවිත ආදර්ශයෙන් පෙන්නුම් කිරීම වැදගත් වන්නේ ඒ නිසායි.

භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ 2000 යේ ජුබිලි වසර මුල් කරගෙන ඉතාමත්ම වැදගත් ශුද්ධාසන ලියවිල්ලක් නිකුත් කළා. ඒ ලියවිල්ලේ නම "රෙඩෙම්ටෝරිස් මිසියෝ" යන්නයි. ඒ විශ්ව ලේඛනයේ එතුමන් ඉතාම පැහැදිලිව මේ ධර්මදූත ක්‍රියාවලිය පැහැදිලි කරනවා. මේ බලන්න එතුමන්ගේ වචන. " ශු. සභාවට පවරා ඇති විමුක්තිදායක කිතු සමිඳුන්ගේ දූත මෙහෙවර පූර්ණ වශයෙන් නිමාවට පත්වී නැත. කිතු සමිඳුන්ගේ ආගමනයෙන් පසු වසර දෙදහසක අවසානය උදාවී ගෙන එන මෙම යුගයේ මානව වර්ගයා දෙස සමස්ථයක් වශයෙන් බලන විට එය මෙකී දූත මෙහෙවරෙහි ආරම්භය පමණක් සේ අපට දිස්වේ. එබැවින් ඒ දූත මෙහෙවර පූර්ණත්වයට පත් කිරීමේ සේවය සඳහා අප මුළු සිතින්ම කැපවීම අනිවාර්යය කාර්යයකි."

ආදර දුවේ පුතේ, ශුද්ධෝත්තම පියතුමන්ගේ ඇරයුම මෙයින් අපට ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. මේ දූත සේවාවට නිමාවක් නැහැ. කුඩා කාලයේ සිටම යහපත් ධර්මදූත වරයෙක් හෝ වරියක් වන්නට ඔබටත් ඉටු කළ හැකි කාරණා එමටයි. අද ඉතාමත් වැදගත් කරුණක් වී ඇත්තේ ජීවිත ආදර්ශයෙන් ධර්මදූත ගති ලක්ෂණ ගෙන හැර පෑමයි. යහපත්කම හා දැහැමියාව එහි ප්‍රධාන තැනක් උසුලනවා. යහපත්කම තුළ හා දැහැමියාව තම ජීවිතය රෝපණය කරන ඕනෑම කුඩා දරුවෙකුට යහපත් ධර්මදූත ලක්ෂණ ජීවිතයෙන් පෙන්නුම් කරන්නට ශක්තියක් ලැබෙනවා. ඒ පමණක් නොව ඒ යහපත් ජීවිත ආදර්ශය තුළ තමන් ඇති කර ගන්නා නිවුනු සිතිවිලි අන් අයගේ ජීවිත වලටත් බලවත් සහනයක් ගෙන එනවා. අන් අයගේ ජීවිත වලට සහනයක් ගෙන එන ඕනෑම කෙනෙකුට යහපත් ධර්මදූත ලක්ෂණ විහිද හරින්නට ශක්තියකුත් ලැබෙන්නේ විශ්වාසය තුළ ඔවුන් බලවත් වන නිසායි.

ආදර දුවේ පුතේ, ඔබ ඔබගේ ජීවිත හැකියාවන් අනුව තම මිතුරන් අතර ක්‍රිස්තුස් වහන්සේට ජීවමාන සාක්ෂිකරුවන් විය යුතුයි. මේ අනුව තමයි හැම කෙනෙක්ම සමිඳුන්ගේ ධර්මදූත සේවාවේ කොටස්කරුවන් බවට පත් වන්නේ. ඔබට පැවරී ඇති කොටස, ඔබ කොහේ හිටියත්, මොනවා කළත්, ඔබ ඉටු කරන්නේ නම් ජේසුස් වහන්සේගේ සභාව ඒ තුළින්මයි ගොඩ නැගෙන්නේ.

අපේ ශ්‍රී ලංකාව තුළ කතෝලික සභාවේ මෙම ධර්මදූත ක්‍රියාවලිය ගොඩ නංවන්නට වෙහෙස මහන්සි වුණු ස්වර්ගස්ථ ගරු පිලිප් ඇන්ටනි පියතුමා ඔබට දායාද කළ ඒ ලස්සන ගීතිකාවේ මෙහෙම පවසනවා නේද ?

*කිතු සමිඳුන් හඳුනා ගන්න - එතුමන් මග පා තබන්න*
*ධර්මදූතයෙක් වෙන්නට මට හරි ආසයි*

*මා සතු දේ බෙදා දෙන්න - අන් අය හා බෙදා ගන්න*
*කිතු සමිඳුන් ගැන කියන්න - එම සුපුවත පතුරුවන්න*
*දහම හොඳින් ඉගෙන ගන්න - ජේසු සමිඳු වැද පුදන්න*
*නැති බැරි අය ගැන සිතන්න - ඒ අය හට සරණ වෙන්න*
*සතුරන් මිතුරන් කරන්න - සාමය යළි ගොඩ නගන්න.*
*ධර්මදූතයෙක් වෙන්නට මට හරි ආසයි.*

ඔබත් මේ ආරාධනාව වැළඳ ගන්න. ඒ තුළ ජීවත් වන්න.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# වටිනා කියනා සාරධර්මයන් සෝදාපාළුවට යාමට ඉඩ නොදෙමු !

කොළොම් තොටින් නැව් නැග්ගා
අපේ රටේ මනුස්සකම
කොළොම් තොටට ගොඩ බැස්සේ
අමනකමයි ඒ වෙනුවට //

ආදරණීය පුංචි දුවේ පුතේ, ඉහත දැක්වෙන්නේ ප්‍රදීපා ධර්මදාස ගායිකාව විසින් ගායනා කරනු ලබන අර්ථාන්විත ගීතයකි. ඒ ගීතයේ අර්ථයට කිමිඳ බැලූ විට පෙනී යන්නේ අධිරාජ්‍යවාදී යටත් විජිත වල බලපෑම් වලට යටත් වූ සමයේ ශ්‍රී ලංකාව තුළ පැවැති මනුස්සකම්. සාරධර්ම කොළඹ වරායෙන් නැව් නැග ඒ වෙනුවට අමනුස්සකම්, නිස්සාරධර්ම අප පුංචි දිවයිනට ගොඩ බැස ඇති අයුරුයි.




දුවේ පුතේ එදා පැවැති නමුත් අද සෝදා පාළුවට ලක්ව ඇති මේ සාරධර්ම යනු කුමක්ද ?

සාරධර්මයක් යනු පුද්ගලයා, සමාජය, ජීවිතය, අර්ථවත් කරන සාරවත් කරන මානුෂීය ගුණාංගයකි. මීට සමාන වචන නම් පුරුෂාර්ථ, ගුණධර්ම, සත්ගුණ ආදිය වේ.

ආගන්තුක සත්කාරයට ලැදි රටක් ලෙස එදා අප කුඩා දිවයින හැඳින්විය හැක. වාඩි වී සිටියේ නම් වැඩිහිටියෙකු දුටු විට නැගිට සිටීම, තම නිවසට පැමිණෙන අමුත්තන් නැදැයින් පිළිගැනීමට පෙර මඟට යාම, තම නිවසින් පිටව යන හිතවතුන් සමඟ මඳක් දුර යාම, මව්පිය වැඩිහිටියන්ට වැඳීම, දෙමාපියන්ට ගුරුවරුන්ට කීකරු වීම, ඔවුනට සැළකිලි දැක්වීම. පොදු හා පෞද්ගලික වැඩ වලදී සහයෝගය ලබා දීම ආදිය යහපත් සාරධර්ම වේ.

අද සමාජයේ සාරධර්ම පිරිහෙමින් පවතී. ලේ කිරි කර පෙවූ අම්මාව නොසළකා මහළු මඩම් වල දමා යාම, ගර්භනී කාන්තාවක් හෝ ආබාධිත පුද්ගලයෙකු බසයට ගොඩ නැගුණ විට තම අසුන නොදී ජනේලයෙන් පිටත බලා ගෙන යාම, මව්වරුන් දරුවන් බිහිකර කුණු කසළ බඳුන් වල දමා යාම ආදි වූ නිස්සාරධර්ම වලට මුලිකත්වය වී ඇත්තේ යුරෝපීය හැඩ ගැසීම් වලට නැඹුරු වීමය.

දුවේ පුතේ මා ඉහත දැක්වූ නිස්සාරධර්ම ඔබේ ජීවිතයෙන් ඈත් කර සාරධර්ම ඔබේ ගෙලට ආභාරණයක් කර ගන්න. එනම් සාරධර්ම ජීවිතයට ළඟා කර ගන්න. එවිට ඔබට දෙපා නොපැකිල ජීවන මඟ සුවසේ ගමන් කිරීමට හැකි වනු ඇත. ජේසුස් වහන්සේ ආදරය කරන්නේ ද එවැනි දූ දරුවන්ටයි.

ලහිරු ලක්ෂාන් ප්‍රනාන්දු, (ආචාර්ය මණ්ඩලය),
ශු. ඌගෝ මුනිඳුන්ගේ දහම් පාසල, බුරුල්ලපිටිය.

# යහපත් එඬේරාණෝ



කිතුනුවන් වන අප යහපත් එඬේරාණෝ කවුදැයි හඳුනති. යහපත් එඬේරාණෝ යනු ජේසුස් වහන්සේය. අපි උන් වහන්සේගේ බැටළුවෝ වෙමු. අපි ජේසුස් වහන්සේ හඳුනමු. ජේසුස් වහන්සේව ශුද්ධවූ බයිබලයේ යහපත් එඬේරාණෝ ලෙස හඳුන්වා දී ඇත. ජේසුස් වහන්සේගේ බැටළුවෝ වන අප එතුමාගේ කටහඬ හඳුනති. ශු. යුප්‍රේසියා මුනිතුමිය ප්‍රථම වරට ආරම්භ කළ නිකාය ද යහපත් එඬේරාගේ කන්‍යාරාමය ලෙස හැඳින්වේ. අපි සැම යහපත් එඬේරා පසුපස යමින් සැමට ගැළවීම ලබා දෙමු. සමාජයේ කොන් වූ අය, බිඳුණු සිත් ඇත්තන්, ධෛර්යමත් කරමු, දිළින්දන්ට උදව් කරමු. අනාථ වූවන්ට පිහිට වෙමු. රෝගී වූවන්ට උපස්ථාන කරමු, ආබාධිතයන්ට උපකාර කරමු. මෙවැනි කුඩා දේවල් වලින් යහපත් එඬේරෙකුගේ පසුබිම ජනතාවට ප්‍රකාශ කළ හැකිය.

එම යහපත් එඬේරාගේ එක් යහපත් වචනයකින් සිත් හැරුණු අයද බොහෝ දෙනෙකු සිටිති. සකේවුස්, පවුකාර ස්ත්‍රිය යන ලෝකයා ප්‍රතික්ෂේප කළ අය ජේසුස් වහන්සේ එක් වචනයකින් ඔහුන්ව යහමගට ගත්හ. අපට එවැනි උතුම් කාර්යයන් කිරීමට ද දෙවියන් වහන්සේ එම වරප්‍රසාදය දී ඇත. උන්වහන්සේට අපව මහමෙරක්සේ වටිති. එවැනි සම්බන්ධතාවයක් එඬේරා සහ බැටළුවන් අතර ඇත. අපගේ නිරන්තර යාච්ඤාව තුළින් මෙම සම්බන්ධතාවය තවත් ප්‍රබලවේ. එනම් බැටළු 100 දෙනෙකු සිටින බැටළු රැලක එක් බැටළු පැටවකු නැති වූ විට එඬේරා තම බැටළු රැළේ සිටින අනෙක් බැටළු පැටවන් 99 දෙනා දමා නැති වූ බැටළුවා සොයා ගැනීමට යති. ඌ ලැබූ පසු පැටවාව කරේ තියා ඉතා සතුටෙන් රැගෙන එති. අප කිතුනු සභාවේ බැටළු පැටවකු නැති වූ විට එතුමා අනෙක් සියලු දෙනා දමා නැති වූ බැටළුවා සෙවීමට යති. බැටළුවන් ගමන් කරන්නේ එඬේරාගේ පිටු පසින්ය. අප වැරදි මඟ යනවා නම් එතුමා අප නිවැරදි මඟට ගනිති.

**ඉතිරිය 07 පිටුවේ...**

**එම්.පී. සුදර්ශනා චාමි පෙරේරා**
**9 ශ්‍රේණිය,**
**වික්ෂෝප දේව මාතා දහම් පාසල - නව හෙට්ටිවිදිය.**

ළමා ප්‍රදීපය
ක්‍රි.ව. 2011 ඔක්තෝබර් 24 සඳුදා

කිතුනු උරුමය

# ශුද්ධ වස්තු ගැන ඔබ දන්නවාද ?



**සාන්ත ඇම්බ්‍රෝස්, සාන්ත ජර්වාසියුස් හා සාන්ත ප්‍රොටාසියුස් මුනි සිරුරු මෙහි දැක්වේ.**

ශුද්ධ වස්තූන් කතෝලිකයන්ට මෙන්ම වෙනත් සියලු ආගම්වල ජනතාව අතර ද ප්‍රචලිතව පවතී. බෞද්ධ, ඉස්ලාම්, කතෝලික, ක්‍රිස්තියානි, කොන්පියුසස් ආදි බොහෝ ආගම් ජනතාව ශුද්ධ වස්තූන් ලෙස සිය දහමේ සුවිශේෂි දෑ වලට ගරු බුහුමන් පුද කරති.

කතෝලික ශුද්ධ වස්තූන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා ඇත. ප්‍රථම පංතියේ ශුද්ධ වස්තූන් වන්නේ සාන්තුවර සිරුරු, සිරුරු කොටස් හා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ගාවිනාව හා සම්බන්ධ කොටස්ය. දෙවන පංතියේ ශුද්ධ වස්තූන් වන්නේ සාන්තුවරයන්ගේ ඇඳුම් පැළඳුම්, ජීවිත කාලයේ භාවිතා කළ දේවල්, ප්‍රාණ පරිත්‍යාගවරයේදී වධ දීමට යොදාගත් උපකරණ, ලේ තැවරුණු වස්ත්‍ර යනාදියයි. තෙවන පංතියේ ශුද්ධ වස්තූන් ලෙස සැලකෙන්නේ ඉහත පළමු පංතියේ හෝ දෙවන පංතියේ ශුද්ධ වස්තූන් ස්පර්ශ කළ රෙදි හා ද්‍රව්‍ය වේ.

ශුද්ධ වස්තූන් හි ප්‍රාතිහාර්යාත්මක ගුණය පිළිබඳව ශුද්ධ ලියැවිල්ල මෙසේ සඳහන් කරයි.

"එලිෂා මිය ගොස් තැන්පත් කළේය. සෑම වසරකදී ම මෝවබ්වරුන්ගේ හමුදා දේශයට ඇතුලු වූහ. මියගිය අයකුගේ මළ සිරුරමිහිදන්කරන්නට රැගෙන යද්දී මෝවබ්වරුන්ගේ හමුදා පැමිණෙනු දැක එලිෂාගේ සොහොන් ගෙයි ඒ මළ සිරුර දැමුහ. ඒ මළ මිනිය එලිෂාගේ ඇටකටුවල ස්පර්ශ වූ සැණින් යළි පණ ලබා නැගී සිටියේය." (2 රාජාවලිය 13:20-21)

සසුන් නීතියේ ද ශුද්ධ වස්තූන් ගැන සඳහන් වේ.

1190:1 - ශුද්ධ වස්තූන් මුදලට අලෙවි කිරීම සපුරා තහනම්ය.

1190:2 - සුවිශේෂි වැදගත් කමකින් යුතු වටිනා ශුද්ධ වස්තූන්ද, ජනතා බුහුමනට ලක් වූ කවර හෝ මට්ටමේ ශුද්ධ වස්තූන් ද ස්ථිරව තබා තිබෙන ස්ථානයෙන් බැහැර කිරීම ශුද්ධාසනයේ නිසි අවසරය රහිතව කළ නොහැකිය.

කිතුනු විශ්වාසයට අනුව ලෝකාන්තිමයේ දී අවසාන විනිශ්චයට සියලුදෙනා ආත්ම ශරීර පිටින් උත්ථානවේ. මරණයේදී ආත්මය හා ශරීරය වෙන් වූව ද අවසාන විනිශ්චය දවසේ ඒවා යළි එක්වන බව අප විශ්වාසයයි.

මේ නිසා ශුද්ධ වස්තූන් විෂයයෙහි ගරු බුහුමන් පිදීම සෑම අයකුගේ වගකීමකි. පුංචි ඔබත් එහෙම නේද ?

**ශිරාන් මෛත්‍රී**



**මාසික සිතිවිල්ල**

මෙහි පළ වන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමඟ ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



මාසික සිතිවිල්ල, "ඔක්තෝබර් මාසය" ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



## පොඩි ෆාදර් ලියයි

ගරු නිරංජන් විජේරත්න (සා. බෙ. නි.) පියතුමා

ආදර දුවේ පුතේ ඔයාලා දන්නවා ඔක්තෝබර් මාසය කියන්නේ ජපමාල මාසය. අපට දේව අම්මාට කිට්ටු වෙන්න තියෙන කාලයක් මේ කාලේ බොහෝ මීසම් වල ජපමාල රැළි, ගීත භාවනා, දේවමාතා ප්‍රතිමාව ගෙයින් ගෙට ගෙන යාම් වගේ දේවල් ගොඩාක් සිදු වෙනවා. ශු. ජපමාලය උච්චාරණය කරලා දේව අම්මාට ළං වෙනවා වගේම අපේම අම්මලා වෙනුවෙන් යාච්ඤා කරලා ඔවුන් අප වෙනුවෙන් කරන කැපවීම අගය කරමු.



# දේව අම්මා අපේ අම්මා කරගනිමු

ඉතින් ආදර දුවේ පුතේ පසුගිය දවස්වල අධික වැඩ නිසා ඔබලාට ලිපියක්වත් ලියන්න වේලාවත් තිබුනේ නෑ, කොහොමද පසුගිය සති කිහිපය ගෙවුනේ. හොඳට අධ්‍යාපන වැඩ ටික කරගෙන ගියාද ? අලුත් වාරයේ පසල් වැඩ කටයුතු එහෙම කොහොමද ?

ආදර දුවේ පුතේ ඔයාලා දන්නවා ඔක්තෝබර් මාසය කියන්නේ ජපමාල මාසය. අපට දේව අම්මාට කිට්ටු වෙන්න තියෙන කාලයක් මේ කාලේ බොහෝ මීසම් වල ජපමාල රැළි, ගීත භාවනා, දේවමාතා ප්‍රතිමාව ගෙයින් ගෙට ගෙන යාම වගේ දේවල් ගොඩාක් සිදු වෙනවා. ශු. ජපමාලය උච්චාරණය කරලා දේව අම්මාට ළං වෙනවා වගේම අපේම අම්මලා වෙනුවෙන් යාච්ඤා කරලා ඔවුන් අප වෙනුවෙන් කරන කැපවීම අගය කරමු.

ඔන්න දුවේ පුතේ දවසක් එක්තරා අම්මා කෙනෙක් තමන්ගේ දරුවන් දෙදෙනත් අරගෙන කෑමක් හොයාගෙන යනවා.මී දවස පුරාම ඇවිද්දා ඒත් කෑමක් හම්බවුනේ නැහැ. අන්තිමේට හවස මේ අම්මාට පාන් ගෙඩියක් හම්බ වෙනවා. මේ අම්මා පාන් ගෙඩිය ලැබුණු ගමන්ම දෙකට කඩලා තමන්ගේ දරුවන් දෙදෙනාට දෙනවා. මේක බලාගෙන ඉන්නවා මිනිස්සු දෙන්නෙක්, එක මිනිසෙක් කියනවා මේ අම්මාට බඩගිනි නැතිව ඇතිව එකයි පාන් ගෙඩිය දෙකට කඩලා දරුවන් දෙන්නට විතරක් දෙන්නේ කියලා. අනිත් මනුෂ්‍යයා කියනවා නෑ මේ අම්මාටත් දරුවන්ට වගේම බඩගිනි දැනෙනවා නමුත් තම දරුවන්ගේ කුස පිරෙනවා දැකලා මේ අම්මා සතුටු වෙනවා කියලා.

හිතලා බලන්න දරුවනි මේ අම්මා මොන තරම් පරිත්‍යාගශීලි අම්මා කෙනෙක් ද ? තම දරුවන් වෙනුවෙන් කොච්චර දේවල් කළාද ? ආදර දුවේ පුතේ ඔබේ අම්මාත් තාත්තාත් මේ වගේ නේ ද ? අද ඔබ ඉන්න තත්වයට ගෙන්න මේ අය මොනතරම් පරිත්‍යාග කැපවීම් කළා ද ? ඔබේ අම්මා ගැන හිතන්න. ඔබව අම්මාගේ කුසේ පිළිසුඳුනු දා ඉඳලා ඔබව ආරක්ෂා කරන්න මොන තරම් දේවල් නම් කරන්න ඇති ද ? ඔබව ඉපදුනාට පස්සේ අම්මාගේ ලේ කිරට හරවලා පොවලා. අම්මා නිදි මරාගෙන ඔබව නිදි කරවන්න ඇති. ඔබට හොඳම ආහාර දෙන්න ඇති. ඇහේ කලු ඉංගිරියාව වගේ ආරක්ෂා කරන්න ඇති. අද ඔබව පාසල් අරින්න සමහර විට ණය වෙන්න ඇති. අලුත් ඇඳුම්, අලුත් සපත්තු, පොත් පත්, පෑන්, පැන්සල් මේ හැමදේම නිකං ලැබෙන්නේ නෑනේ. සමහර විට අම්මා උදේම ටිකක් කාල ඔබට හොඳ බත් ටික බෙදන්න ඇති. අම්මා මාළු ඔළුව කාලා ඔබට හොඳ කෑල්ල දෙන්න ඇති. ඒත් දුවේ පුතේ ඔබ අම්මාට කෑම ඉල්ලලා මොනතරම් නම් කරදර කරනවාද ? අරවා කන්න බෑ මේවා කන්න බෑ කියලා.

අම්මාට අසනීප වුණු වේලාවේ අම්මාව බලා ගන්නවාද ? ඔබ අසනීප වුණු වේලාවේ අම්මා ඔබේ ළඟින් හෙල්ලෙන්නේ නැතිව ඇති. ඒ ඔබේ අම්මා ඔබට පැනඩෝල් පෙත්තක් ගෙනත් දෙන්න කිව්වාම ඔබ බෑ කියනවා නේ ද ? කඩේ යන්න කිව්වාද අදිමදි කරනවා නේ ද ? ඔබේ අම්මා දැන් වයසයි ඔබ දැන් ඔබේ අම්මාව ගනන් ගන්නේ නැහැ නේ ද ? අම්මා වලං හොදලා නියපොතු කළු වෙලා අත ගොරෝසු වෙලා එත් ඒ ඔබේ අම්මා කියලා යාළුවන්ට කියන්න ලැජ්ජයි නේ ද ?

ඉතිරිය 14 පිටුවේ

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලයේ
ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයේ II වන කොටසේ පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය. කෙටි පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න 10 ක් මෙහි ඇතුළත් ය. මෙවර කතෝලික ධර්මය විභාගයට පෙනී සිටින අපේ දුවා පුතාලා වෙනුවෙන් මෙම අනිවාර්ය ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා ඔබ මෙම ආදර්ශ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා මෙයට හුරුවන්න.

**කෙටි පිළිතුරු සපයන්න.**

1. මුල් කිතුනු සභාවේ දක්නට නැති ලක්ෂණය ලියන්න.
2. පොදු පූජකවරය මගින් ගිහියාට පැවරෙන කාර්ය දෙකක් ලියන්න.
3. දෙවියන් වහන්සේ පූර්ණ වශයෙන් අනාවරණය වන්නේ කා තුළින් ද ?
4. තමාගේ ගැලවීමත් අන්‍යයන්ගේ ගැලවීමත්ත සලසා දෙන ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
5. පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳව විශිෂ්ට කෘතිය කුමක් ද ?
6. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කළ හැකි මාර්ග දෙකක් ලියන්න.
7. මැවිල්ලට එරෙහිව ක්‍රියාකාරී වීමෙන් ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න.
8. ලන්දේසි පීඩන යුගයේ දී මෙරට කතෝලික විශ්වාසය රැකදුන් ධර්මදූත නිකාය නම් කරන්න.
9. සාධාරණ ලෙස වස්තුව ලබා ගත හැකි මාර්ග දෙකක් ලියන්න.
10. දේව රාජ්‍යයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
11. "වැඩිමලා බාලයාට සේවය කරනු ඇත" යන ප්‍රකාශය හා සම්බන්ධ වන පුරාණ ගිවිසුමේ චරිත දෙක නම් කරන්න.
12. ලූක් සුපුවතෙහි සඳහන් වන ප්‍රශංසා ගීත දෙකක් නම් කරන්න.
13. පෘතුගීසි සමයේ පළමු ධර්මදූත කණ්ඩායම ලෙස මෙරට සේවය කළ පැවිදි නිකාය නම් කරන්න.
14. සුවදානයේ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
15. නව ගිවිසුමෙහි නිල පූජකවරය දානය කිරීම අඛන්ඩව ගෙන ගියේ කුමන තෝරා ගැනීම තුළද ?
16. සුවිශේෂක අනුශාසනා පිළිපදින අය දෙන පොරොන්දු හෙවත් වෙද භාර තුන නම් කරන්න.
17. ලංකා කතෝලික සාහිත්‍යයේ පියා යන විරුදාවලිය හිමි වන්නේ කවුරුන්ට ද ?
18. අතීතයේ සීනයි අර්ධද්වීපයෙහි දස පනත මුල් කරගෙන මහා ජාතියක් බවට පත් වූයේ කවුරුන් ද ?
19. "දස පනත පිළිපැදීම පමණක් සදාතන ජීවිතය සඳහා ප්‍රමාණවත් නොවේ." මේ සත්‍යතාවය තහවුරු කිරීමට ජේසුස් වහන්සේ වදාළ උපමාව නම් කරන්න.
20. "ස්වාමිනි, මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව" යන යැදුම කවුරුන්ගේ නිර්මාණයක් ද ?
21. මතෙව් සහ ලූක් සුබාරංචි මංගල වාක්‍ය හෙවත් භාග්‍ය අට හඳුන්වන්නේ කුමන දේශනා නමින් ද ?
22. ශුද්ධාත්මයාණන් පැමිණි කල ලෝකයාට වටහා දෙන කරුණු දෙකක් නම් කරන්න.
23. පළමු සහ දෙවන මැවීමේ කථා පුවත් අයත් වන සම්ප්‍රදායයන් දෙක පිළිවෙලින් නම් කරන්න.
24. දෙවන වතිකානු මන්ත්‍රණ සභාව පෙන්වා දෙන පරිදි යහපත් පාපෝච්චාරණයක් කිරීම සඳහා මනස්ථාපනය වන්නා විසින් කළ යුතු ක්‍රියා දෙකක් නම් කරන්න.
25. රෝගීන්ගේ ආලේපනය පිළිබඳව සඳහන් වන නව ගිවිසුම් හසුන නම් කරන්න.
26. පොදු පූජකවරය තුළ ගිහියාට පැවරෙන පූජක සේවා දෙකක් නම් කරන්න.
27. යාච්ඤා කිරීමේදි තිබිය යුතු ගුණාංග කවරේද යන්න පැහැදිලි කිරීමට ලූක් සුබාරංචිය පමණක් ඉදිරිපත් කරන උපමා දෙකක් නම් කරන්න.
28. "වචනය තෙම ද මාංශ වුණේය. අප සමග ද වාසය කෙළේය" යන මේ වගන්ති අඩංගු යාච්ඤාව කුමක් ද ?
29. තම වස්තුව හේතුවෙන් තමන් ගැන පමණක් සිතා අනුන් ගැන නොසිතන අයට වන විපත පෙන්වා දීමට ජේසුස් වහන්සේ කළ උපමාව නම් කරන්න.
30. සභාව නොවරදින සුළු භාවය මෙහෙයවා උගන්වන්නේ කුමන අවස්ථාවලදී ද ?
31. ශුද්ධවූ පාවුළු තුමා ගෙන හැර දක්වන මිනිසා තුළ පවතින ශරීර දෙවර්ගය නම් කරන්න.
32. "යමෙක් මේ මුළු ලෝකය ලබා ගත්තත් තම ආත්මය නැති කර ගත්තොත් ඔහුට ඉන් කුමන ඵලක්ද ?" මෙය කවුරුන් විසින් කියන ලද්දක්ද ?
33. ක්‍රිස්තියානි ජීවිතයේ ආරම්භක ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න.
34. "ප්‍රසාද නිධානයන්ගේ ප්‍රසාද නිධානය" යන නමින් හඳුන්වන ප්‍රසාද නිධානය කුමක්ද ?
35. ජනවන්දනාවේ ප්‍රධාන අංග තුනෙන් දෙකක් නම් කරන්න.

36. ජනවන්දනාව පවත් වන පිරිස කවුද ?
37. දස පණත පිළිබඳව ශුද්ධවූ බයිබලයේ සඳහන් වන්නේ කුමන ග්‍රන්ථයෙහි ද ?
38. "යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී" යනුවෙන් පැවසුවේ කවුරුන් ද ?
39. යාච්ඤාවේ දී අනුන් හෙළා නොදැකීමටත්, තමන් පාරට්ටු කර ගැනීමත් නොකළ යුතු බව දක්වන්නට ජේසුස් වහන්සේ වදාළ උපමාව නම් කරන්න.
40. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව දැක්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමාවක් නම් කරන්න.
41. ආධ්‍යාත්මික ශරීරය සහ ස්වාභාවික ශරීරය ගැන කියවෙන ශුද්ධවූ පාවුළු තුමාගේ ලිපිය කුමක් ද ?
42. "ඉශ්‍රායෙල්" නමින් හඳුන්වන ලද්දේ කවුරුන්ද ?
43. මිසරයට පැමිණි පළමු සහ අවසාන වසංගත පිළිවෙලින් නම් කරන්න.
44. ප්‍රසාද ස්නාපනයේ අත්‍යවශ්‍ය පිළිවෙත නම් කරන්න.
45. විශ්වාසකයින්ගේ ආත්මයෙහි නොමැකෙන ලාංඡනයක් පදිංචි වන නිසා දේව ප්‍රසාද නිධාන තුනක් එකවරකට වඩා ලබා ගත නොහැකිය. එම දේව ප්‍රසාද නිධාන තුන කවරේද ?
46. මුල් ක්‍රිස්තියානීන් විසින් දිව්‍ය සත්ප්‍රසාදය හඳුන්වනු ලැබුවේ කුමන නමින්ද ?
47. තම පිරිසිදුකම වෙනුවෙන් ජීවිතය පූජා කළ ළමා ශුද්ධවන්තිය නම් කරන්න.
48. අසල්වැසියාට ප්‍රේම කිරීම සඳහා අප විසින් කළ යුතු ප්‍රධාන පුන්‍ය ක්‍රියා දෙවර්ගය නම් කරන්න.
49. ශුද්ධවූ සභාවේ යාච්ඤා ප්‍රභේද තුන නම් කරන්න.
50. ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් මැදිහත් වන යාච්ඤාවේ පෙර නිමිත්ත වුයේ කාගේ යාච්ඤාව ද ?
51. තාපස ජනපද හඳුන්වන නම කුමක් ද ?
52. "ගායනය යනු දෙවරක් යැඳුමකි" යනුවෙන් ප්‍රකාශ කළේ කවුරුන් ද ?
53. මිනිසා තුළ පවතින ආධ්‍යාත්මික ලක්ෂණ දෙකක් නම් කරන්න.
54. දේව සමානකම යන්නට අයත් වන ලක්ෂණ දෙකක් නම් කරන්න.
55. ස්නාවක ජොහාන් හඳුන්වන වෙනත් නමක් ලියන්න.
56. ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළින් බිහිවූ දේශීය පැවිදි පන්ති දෙකක් නම් කරන්න.
57. නිළ පූජක ධුරයේ අවස්ථා දෙකක් නම් කරන්න.
58. උත්තම පූජක යාච්ඤාව සඳහන් වන සුවිශේෂය නම් කරන්න.
59. ප්‍රැන්සිස් නමැත්තා වෙනුවට තමාව මරණය සඳහා තෝරා ගන්නා යැයි කියමින් නට්සි නායකයා වෙත ගිය පියතුමා නම් කරන්න.
60. හෘදය සාක්ෂිය යනු කුමක් ද ?
61. ජේසුස් ස්වාමීන් වහන්සේ විජාතීන් තුළ තිබූ ගුණවත්කම තහවුරු කිරීමට ගෙන හැර දැක් වූ උපමාවක් නම් කරන්න.
62. දෙවියන් වහන්සේගේ පුත්‍රභාවය ලබා ගැනීම සඳහා කන්ද උඩ දේශනයට අනුව අප විසින් කළ යුතු කාර්යය නම් කරන්න.
63. මතු වඩින්නට සිටි තැනැත් වහන්සේ වූ ක්‍රිස්තුන් වහන්සේ ගේ පූර්වාදර්ශය කවුද ?
64. දෙවියන් වහන්සේ දකින්නට අප තුළ තිබියු යුතු සුදුසුකම් දෙකක් නම් කරන්න.
65. ප්‍රසාද ස්නාපනයෙන් හිමි වන පොදු පූජකවරය සුවිශේෂී තත්ත්වයට පත් වන දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
66. ජේසුස් ස්වාමීන් වහන්සේගේ ප්‍රසාද ස්නාපනය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන සුවිශේෂකවරු කවු ද ?
67. අභිවෘද්ධි ආලේපනයේ වැදගත්කම සිද්ධිය කුමක් ද ?
68. ක්‍රිස්තියානි ජීවිතයේ උල්පත සහ මුදුන් මල්කඩ කුමක් ද ?
69. ස්වර්ගයෙහි වැඩ සිටින යාච්ඤාව සඳහන් වන සුවිශේෂකවරු දෙදෙනා නම් කරන්න.
70. මව-පියා- දරුවෝ අතර සබඳතාවය මිහිපිට කුමක් සංකේතවත් කරයි ද ?
71. කතෝලික සභා මාතාව 2008/2009 වසර කැප කරන ලද සාන්තුවරයා කවු ද ?
72. ජේසුස් ස්වාමීන් වහන්සේ විසින් සිදු කරන ලද පාද දෝවනය සඳහන් සුවිශේෂය නම් කරන්න.
73. ලූක් සුබාරංචියට අනුව ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණව දිවැස් වැකි පැවසුවේ කවුද ?
74. ක්‍රිස්තුන් වහන්සේගේ සේවක ස්වභාවය හෙවත් දුක් විඳින සේවකයා යන්න වඩාත් පැහැදිලිව ඉදිරිපත් කරන දිවැසිවරයා කවුද ?
75. ක්‍රිස්තුන් වහන්සේගේ රජකම සදහටම පවතින බවත්, ඔවුන් වහන්සේගේ රාජ්‍යය සදා පවතින බවත් දාවිත් රජතුමාට පැහැදිලි කර දෙන දිවැසිවරයා නම් කරන්න.

**මෙම කෙටි ප්‍රශ්න 75 සඳහා පිළිතුරු ලබන සතියේ බලාපොරොත්තු වන්න. ආදර දුවේ පුතේ, සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින ඔබගේ කතෝලික ධර්මය විෂයට අදාළ ගැටලු සහගත සහ අපැහැදිලි තැන් අපට ලියා එවන්න.**

**ළමා ප්‍රදීපය, සා. පෙළ පුනරීක්ෂණ පාඩම් මාලාව,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය, කොළඹ 08.**

# බර්නාඩෝ ඩැඩි

ඉතාලි ජාතික බර්නාඩෝ ඩැඩි වර්ෂ 1280 දී ඉතාලියේ ෆිරෙන්සි හි උපත ලබා ඇත. සුප්‍රකට චිත්‍ර ශිල්පි ගියොට්ටෝ යටතේ ආධුනිකයකු ලෙස චිත්‍ර කලාවට අත්පොත් තැබූ බර්නාඩෝ ඩැඩිගේ චිත්‍ර විචාරක මෙන් ප්‍රේක්ෂකයන්ගේ ද මහත් බුහුමනට ලක්ව තිබේ. දේව මාතාවන් පිළිබඳව සිතුවම් ගණනාවක් නිර්මාණය කර ඇති මේ චිත්‍ර ශිල්පියා 1348 දී ෆිරෙන්සිහි දී අවසන් හුස්ම හෙළීය.



කන්‍යා මරියාවන්ට මංගලම් කීමේ අවස්ථාව
1335
පැරිසියේ ලුවර් කෞතුකාගාරය



දේව මාතාව හා දෙව් බිළිදා ත්‍රිත්ව රූප නිර්මාණය

1333

ෆොලෝරන්ස්හි



කන්‍යා මරියාවන් හා දෙව් බිළිඳා

1346-47

ජෝලෝරන්ස්හි සැන්මිචෙල්

ශිරාන් මෛත්‍රී



දේව මාතාව හා ළදරුවා - ත්‍රිත්ව රූප නිර්මාණය
1338 - 40
ජර්මනියේ බර්ලින් නුවර ස්ටැට්ච් කෞතුකාගාරය



දේව මාතාවන්ට ඔටුනු පැළඳවීම - ත්‍රිත්ව රූප නිර්මාණය

1335-1340

ඇටෙන්බර්ග්හි ලින්ඩිනුවා කෞතුකාගාරය



කන්‍යා මරිය
මාතාවන්ට ඔටුණු
පැළැඳවීමේ
අවස්ථාව
1340
ලන්ඩන් නුවර
ජාතික කලාගාරය

කන්‍යා මරිය
මාතාවන්ට ඔටුණු
පැළැඳවීමේ
අවස්ථාව
1340
ඇටෙන්බර්ග්
ලින්නූවා
කෞතුකාගාරය





# ලොව කිතුනු කලා අසිරිය



දේව මාතාව හා ළදරුවා
ත්‍රිත්ව රූප නිර්මාණ සමීප රූප
1335 - 1940
ඇටෙන්බර්ග් ලින්ඩිනුවා කෞතුකාගාරය



කන්‍යාව සහ ළදරුවා සාන්තුවරුන් සමඟ
සිංහාසනාරූඪ කිරීම
1340 - 1345
ෆ්ලොරන්ස්හි කෞතුකාගාරය



කන්‍යාව සහ දරුවා
1340 - 1345
ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර දයිසින්
කෞතුකාගාරය

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 30

අපි ඉහත වැකි වර්ග හතරම Indirect Speech වලට හරවමු.

**1.** (ප්‍රකාශිත වැකි)

අපි කලින් Indirect Speech වලට හැරෙව්වෙ මේ වර්ගයේ වාක්‍යය නිසා ඒක එතරම් අමාරු නෑ.

1. " I am hungry" (Direct Speech)
   He said that he was hungry. (Indirect Speech)
2. "Sumith goes home by bus." (Direct Speech)
   He said that Sumith went home by bus. (Indirect Speech)
3. "The sun rises in the east" (Direct Speech)
   He said that the sun rose in the east. (Indirect Speech)

**2.** මීළඟට අපි ප්‍රශ්න **(Questions)** වෙත යොමුවෙනවා.

Direct Speech වලින් තිබෙන්නේ ප්‍රශ්නයක් Indirect බවට පත්කරද්දී Reporting Clause එකට "asked", "inquired" , යනාදි වචන යොදනවා.

He asked me... (ඔහු මගෙන් ඇහැව්වි..)
He inquired... (ඔහු විමසුවා...)

යනාදි වශයෙන් අපි වාක්‍යයේ මුල් කොටස නිර්මානය කරගත යුතු වෙනවා.

ප්‍රකාශිත වාක්‍ය Direct Speech වලින් Indirect බවට හරවද්දී අපි Reporting Clause එක සහ Reported Clause එක (කොටු කොමා ඇතුලෙ ඇති කොටස) සම්බන්ධ කිරීමට "that" වැනි වචනයක් යොදාගන්න හැටි ඔබ දැක්ක.

නමුත් මේ ප්‍රශ්න වල දී අපි "that" යන සම්බන්ධිකරණ වචනෙ යොදන්නෙ නෑ. ඒ වෙනුවට යොදන්නෙ "If" හෝ "whether" වැනි වචනයක්.

මොකද්ද - what, කොහෙද? - where, ඇයි? - why?, යනාදි ප්‍රශ්න අසන වචන තිබුණොත් ඒවා යොදන්නත් පුළුවන්.

දැන් අපි ඉහත සඳහන් කළ ප්‍රශ්ණ INDIRECT SPEECH වලට හරවමු.

1. "What are you doing?" (Direct Speech)
   He asked me what I was doing.
2. "Where do you live?" (Direct Speech)
   He inquired where I lived. (Indirect Speech)
3. "Did you drink your tea?"
   He asked me whether I drank my tea.

තව නිදසුන් දෙකක් බලමු.

4. "Can you please wait for me" Ranjith asked. (Direct Speech)
   Ranjith asked me whether I could wait for him. (Indirect Speech)
5. Kanthi asked Nilanthi, "Is it raining?"
   Kanthi asked Nilanthi if it was raining"

**3.** ඊළඟට අපි විධාන සහ ඉල්ලීම් **Indirect Speech** වලට හරවමු.

මෙහිදී අපි බොහෝ විට "to" නමැති preposition එක යොදනවා සම්බන්ධිකරණයට.

1. " Please go away"
   He asked me ***to go*** away.
3. Kusum told Kamala, "Please let me go."
   Kusum requested Kamala ***to let*** her go.

තව නිදසුන් දෙකක් බලමු.

4. Mother told her son, "Come quickely. Don't be late" (Direct Speech)
   Mother asked her son **not to** be late but come quickly.
   "යමක් කරන්න එපා" යන අදහස පැවසීමේදී "not to" යන වචන අපිට යෙදිය හැකියි.
5. The teacher said, "Be quiet and listen to my words."
   ගුරුවරයා කිව්වා "නිශ්ශබ්ද වෙලා මගෙ වචන වලට කන් දෙන්න" (Indirect Speech)

The teacher urged them to be quiet and listen to his words.

(මෙහිදී urged කියන්නෙ උනන්දු කළා වැනි අදහසක් දෙන වචනයක්. ඒ වෙනුවට requested, asked, වගේ වචනත් යොදන්න පුළුවන්)

මතක තබා ගන්න මේ වගේ විධාන හෝ ආයාචනා සම්බන්ධ වැකි වලදී ඒ සමඟ ක්‍රියා පදයේ වර්තමාන ස්වරූපය යෙදෙනවා මිසක් අර ප්‍රකාශිත වාක්‍ය වල වගේ ක්‍රියා පදය අතීතයට පෙරලීමක් සිදුවෙන්නෙ නෑ. to go.. to be quiet, to shut up... යනාදි වශයෙන් යොදනවා මිසක් to went, to drank, to talked යනාදි වශයෙන් යොදන්නෙ නෑ. ඒ සමඟ හැම විටම වර්තමාන ක්‍රියා පදයක් මිසක් අතීත පද යොදන්නෙම නෑ.

**4.** **මීළඟට අපි අවසාන වාක්‍ය වර්ගය හෙවත් විශ්මය පලකරන සහ ආශිර්වාදාත්මක වැකි Indirect බවට හරවන හැටි බලමු.**

මේ වාක්‍යවල දී ත් තමන්ට කැමති විදිහට වැකියෙන් කියවෙන අදහසට අනුකූලවන විදිහට Reporting Clause එකට වචන යොදන්න පුළුවන්.

1. "Oh God! help me." (Direct Speech)
He begged God to help him. He pleaded with God to help him.
ඔහු බැගෑපත් වුනා, කන්නලව් කළා වැනි අදහස් මේ වැකිවලින් කියැවෙනවා. මේ වගේ සුදුසු වචන පාවිච්චි කරන්න පුළුවන්.

2. "Great! how clever you are!" (direct) She exclaimed he was very clever. (indirect)
ඇය සතුටින් ප්‍රකාශ කළා ඔහු කෙතරම් දක්ෂ ද කියලා.

3. Nimal said, "Thanks! how nice of you!" (direct)
Nimal gratefully said that he was a nice person. (indirect)
නිහාල් ස්තුති පූර්වකව ප්‍රකාශ කළා ඔහු කෙතරම් හොඳද කියලා.

**තව නිදසුන්:**

4. Sujatha said, "What a beautiful scene !" (direct)
සුජාතා කිව්වා "කොච්චර ලස්සන දර්ශනයක්ද?"
Sujatha exclaimed with joy that it was a beautiful scene. (Indirect)

5. He told "how cruel the terrorists are!" (direct)
ඔහු කිව්වා, "ත්‍රස්තවාදීන් මොනතරම් දරුණු ද"
He exclaimed with sadness that the terrorits were cruel. (Indirect)

DIRECT සහ INDIRECT SPEECH පිළිබඳව අවසාන පාඩම වශයෙන් අපි එක දසුනකින් සියලුම Tenses වලින් (කාල වලින්) Direct සහ Indirect වාක්‍ය හදන හැටි එක රාමුවකට ගොනු කරල ඉගෙන ගනිමු.

මතක තබා ගන්න. ඔබ මෙම ඉංග්‍රීසි පාඩම අධ්‍යයනය කළ යුත්තේ අ.පො.ස. විභාගය සමත් කිරීම සඳහා පමණක්ම නොවේ. එදිනෙදා ජීවිතයේ දී අත්‍යවශ්‍ය වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක් ලැබීම සඳහා මෙම පාඩම් උපයෝගී කරගන්න. මෙම පාඩම් සැකසෙන්නේ එම අරමුණ ඇතිවයි.

ඒ නිසා ඔබට ඉතා පුළුල් ඉංග්‍රීසි දැනුමක් ලැබීමට අවශ්‍ය වන මෙම Direct සහ Indirect Speech වලට අදාළ මෙම වගුවල සඳහන් රීති ඉතා පැහැදිලිව අවබෝධ කරගෙන එදිනෙදා ඉංග්‍රීසි කථාවේදී භාවිතා කරන්න.

| **Direct Speech** | **Indirect Speech** |
|---|---|
| **Present Simple** (ප්‍රසන්ට් සිම්පල්) | **Past Simple** (පාස්ට් සිම්පල්) බවට පෙරළේ. |
| "I live in Colombo." | He said that he lived in Colombo. |
| "I don't like Cricket." | He said that he didn't like Cricket |
| "Sherene is a doctor." | He said that Sherene was a doctor. |
| "Sunitha is not a teacher." | She said that Suneetha wasn't a teacher. |
| **Present Continuous** (ප්‍රසන්ට් කන්ටිනියුවස්) | **Past Continuous** බවට පෙරළේ (පාස්ට් කන්ටිනියුවස්) |
| "I am cleaning my house today." | She said that she was cleaning her house today. |
| "I am not going to church today. | She said that she was not going to church that day. |
| "Mother is cooking rice." | She said that mother was cooking rice. |
| "She isn't singing today." | She said that she wasn't singing that day. |
| **Present Perfect** (ප්‍රසන්ට් පර්ෆෙක්ට්) | **Past Perfect** (පාස්ට් පර්ෆෙක්ට්) බවට පෙරළේ. |
| " I have seen that film." | She said that she had seen that film. |
| "I haven't heard that song before." | She said that she hadn't heard that song before |
| "Sunil has called Anil three times." | Sunil said that he had called Anil three times. |
| "He hasn't left any message." | He said that he hadn't left any message. |
| **Present Perfect Continuous** (ප්‍රසන්ට් පර්ෆෙක්ට් කන්ටිනියුස්) | **Past Perfect Continuous** (පාස්ට් පර්ෆෙක්ට් කන්ටිනියුස්) බවට පත්වේ. |
| "Tony has been drinking." | He said that Tony had been drinking. |
| "He hasn't been studying." | He said that he hadn't been studying. |
| "Anil and Sunil have been working." | He said that Anil and Sunil had been working. |
| "They haven't been sleeping." | He said that they hadn't been sleeping. |

## අපගේ ගැළවුම්කරුවාණෝ



**ඩබ්.ඩී. ඇන් නිමේෂා**
5 ශ්‍රේණිය,
ආවේ මරියා ශාඛා පාසල,
බෝලවලාන

පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## දිව බොදුනින් පෝෂණය වෙමු



**සුධාර කනිෂ්ක**
5 ශ්‍රේණිය,
ක්‍රිස්තු රාජ දහම් පාසල,
මෝදරවැල්ල,
තල්විල මීසම.

## දේව මෑණියෝ



**එච්.පී. බෙන්ජමින්**
6 ශ්‍රේණිය,
පාතිමා දහම් පාසල,
පඬිවත්ත

## සුබ උපන්දිනයක් !



**බී.ඒ. අමිස්ක මදුෂාන්**
5 ශ්‍රේණිය,
සා. අන්තෝනි දහම් පාසල,
බණ්ඩාරවෙල.

## සා. දොමිනික් සාවියෝ මුනිතුමා



**පීටර් ෂෙමිල් මුතුකුඩආරච්චි**
4 ශ්‍රේණිය,
සා. ජෝශප් විදුහල,
කොළඹ 10.

## අපේ ගෙවත්ත



**සමිත් පෙරේරා**
5 ශ්‍රේණිය,
ජේසු බිළිඳු ධර්මදූත ළමා සමාජය
කලමුල්ල

## සමගියෙන් ජීවත් වෙමු




**මිනෝලි ටානියා**
8 ශ්‍රේණිය,
සා. අන්තෝනි දහම් පාසල, ඕපාත.

## පැල සිටවන ළමුන්



**ටී. රන්දික දේශාන් පීරිස්**
7 ශ්‍රේණිය,
ශු. පාතිමා දහම් පාසල, මුදුකටුව.

## මාළු ටැංකියක්



**එච්. සහන්යා දෙව්මිණි පෙරේරා**
1 ශ්‍රේණිය,
ශු. ප්‍රැන්සිස් අසීසි දහම් පාසල,
උඩුගම්පොළ

## බදුල්ල පදවිය



බදුල්ල සා. මරියා ආසන දෙව් මැදුරේ ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද ලැබූ දූ දරුවන් 24 දෙනා දේව මෙහෙයෙන් පසු මීසම් සේවක ගරු ප්‍රියාලාල් කුරේ සහයක මීසම් සේවක ගරු දේව රාජන් යන පියතුමන්ලා ද ළමුන් පුහුණුව කළ ගරු ශිරානි ප්‍රනාන්දු පැවිදි සොයුරිය සහ දහම් ගුරුවරියන් සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**(ශ්‍රීකාන්ති ගුණවර්ධන)**

## අගරදගුරු පදවිය






කොරළවැල්ල සා. මිඛායෙල් දේවස්ථානයට අයත් ළමුන් 32 කට මීසම් සේවක ගරු ලියෝ කැමිලස් පියතුමා අතින් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. කොරළවැල්ල ශා. මයිකල් දහම් පාසලේ ගුරුවරු පැවදි සොයුරියන් හා මීසම්පති ගරු ලියෝ කැමිලස් පියතුමා හා ගරු රෙජිනොල්ඩ් ජයමහ පියතුමා (නි.ම.නි.) සමග දිව බොදුන් ලැබූ ළමුන් සමග සේයාරුවකට මෙසේ මුහුණ දුන්හ.

**( සටහන - නිශ්ශංක පීරිස්, සේයා - ඇලෙක්ස් ජේ. සිල්වා )**



**සිසිල් ඩැනීසියස්**

කඳවල මීසමට අයත් කටාන - බටපත්තල සා. තෙරේසා දහම් පාසලේ දූ දරුවන් 13 දෙනෙක් ප්‍රථම වරට දිව බොදුන් ලැබුහ. දිව්‍ය යාගයෙන් අනතුරුව මීසම් සේවක ගරු සරත් තිරිමාන්න මීසම් සහයක ගරු ජූඩ් පෙරේරා යන පියතුමන්ලා සහ කඳවල ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ගරු සේපාලිකා තිරිමාන්න, ගරු ගර්ට්රූට් පීරිස් පැවිදි සොයුරියන්, ළමුන් පුහුණු කළ දහම් සේවක සේවිකාවන් සමගින් දිව බොදුන් ලැබූ දූ දරුවෝ මෙසේ ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන්හ.

03 පිටුවෙන්....

ඒවාගේම යහපත් එඬේරෙකුගේ ඇති සුවිශේෂ ගුණාංග යක් වන්නේ තම බැටළු රැළ ආරක්‍ෂා කිරීම සඳහා තම ජීවිතයද පුද කිරීමය. මදක් සිතා බලන්න. එදා ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේදී එම අවස්ථාවේදී ජේසුස් වහන්සේ අප උදෙසා තම ජීවිතය පූජා කරන ලදි. එම සිද්ධියෙන් අපට මතක් කරන්නේ, උන්වහන්සේ, අපට සිදුවන කරදර සහ අනතුරු අවස්ථා වලද අප වෙනුවෙන් මැදිහත් වෙන බවය. මෙම සියලුම අවස්ථා වලින් උන්වහන්සේ අපට කතා කරන්නේ උන්වහන්සේ පසුපස අපට නිතර ගමන් කරන ලෙසටය.

## නොවේ අමතක ඔබේ මතකය !

වසරක් ගෙවිලා නෑ - අමතක වුයේ මා පියේ
ඇනුනේ නෑ පියේ පියේ - වසරක් ගෙවිලා ගිහිල්ලා
වරසක් උදා වුවාද පියේ - ඇල්වු පහන නිවිලා
මතකයට ආවිට ඔබ මා නෙතගින්
ගැලෙන්නේ උණු කඳුලැලිය මා පියේ
මා පියේ ඔබ මැවී පෙනුනත්
ඇයි බැරි මට ඔබේ දෑත් අල්ලන්නට
අල්ලන්ට බැරි වෙන්න
ඇයි අප තනි කෙරුවේ පියේ.
අප කළ වරද කිමද පියේ
මෙතරම් දඩුවම් දීමට අප හට
දෙන්න අප හට කමාව පියේ
ගන්න අප ඔබේ තුරුලට පියේ



**ඇව්රිල් ඉමලින් බෙරෙන්ජ්**
**6 ශ්‍රේණිය, උසස් බාලිකා විද්‍යාලය - ත්‍රිකුණාමලය**




ඔක්තෝබර් මස 23 වන දිනට යෙදෙන ලෝක ධර්මදූත ඉරුදින අළලා සැකසු “ධර්මදූතයෙක් වන්න” මෙවර කිතුනු ළමා හමුවෙන් ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයෙන් ඔක්තෝබර් 23 වන දින ප. ව. 5.30 මෙය ප්‍රචාරය වේ. මෙම වැඩසටහන මෙහෙයවනු ලබන්නේ ජූඩ් අයිවන් මහතා විසිනි.

**ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්යය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.**
**අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

05 පිටුවෙන්

ආදර දුවේ පුතේ දවසක් එක්තරා අම්මා කෙනෙකුට දුවෙක් ඉපදුනා හැබැයි මේ දුව වපරයි, කැතයි, පස්සේ මේ අම්මා මොනවද කළේ තමාගේ ඇහැක් ගලවලා දුවට සවිකළා. නමුත් අවාසනාවකට මේ දුව ලොකු වෙද්දි අම්මාට ලැජ්ජා කළා. අම්මාව ඉස්කොලේ එන්න එපා කිව්වා. අම්මා හරිම වේදනාවෙන් හිටියේ. තව ද ගේ ළඟ ඇන්ටි කෙනෙක් මේ දුවට කිව්වා දුව අම්මාට ඔහොම සලකන්න එපා. අද ඔයා ලස්සනට ඉන්නේ ඔයාගේ අම්මා නිසා කියලා. එදා නම් මේ දුවට හොඳටම දුක හිතිලා අඩලා අම්මාගේ කකුල් දෙක අල්ලා සමාව ගත්තා.

මගේ ආදර දුවේ පුතේ ඔබේ අම්මාටත් ඔබ හරියට සලකලා නැතිව ඇත. හිත රිදවලා ඇති. එහෙනම් මේ ලියුම කියව්වාට පස්සේ අම්මා ලඟ දණින් වැටිලා සමාව ඉල්ලන්න. අම්මාව ආදරයෙන් බලා ගන්න. අම්මා ගැන කියන මේ ගීතිකාව මෙනෙහි කරමු.

සාගරයටත් වඩා ගැඹුරුයි ආදරය ඔබගේ
අම්මේ අම්මේ ආදරය ඔබගේ
අම්මේ අම්මේ ආදරය ඔබගේ

දරුවෝ ටික යහතින් සිටි නම් ඔබේ සැපත එයයි
එකකු හෝ දුක මැද සිටි නම් ඔබේ සිත එතනයි
ඔබේ සුව සැප නොවේ සිතුවේ දරුවෝ ගැනම තමයි
දරුවන්ගේ දරුවන් හට අම්මා ඔබයි

සැවෝම සුවසේ නිදාගත් පසු ඔබ නිදා ගන්නේ
දරුවෝ ටික නැගිටින්න කලියෙන් ඔබයි නැගිටින්නේ
සැවෝම එක්කොට දෙවිඳු දෑතට ඔබ භාර දෙන්නේ
අම්මේ ඔබමයි පහන නිවසට එළිය ගෙන දෙන්නේ

පිසු බත් ටික ඔබ නොකෑවත් මගේ කුස පිරුනා
මගේ කැතකුණු ඔබට පිළිකුල් වුනේ නෑ කිසි දා
කෙලෙස මා ඔබ හැර දමන්න ඔබට බැරිවු ද
සුවය ශක්තිය දෙන්න සමිදේ මගේ මවට සදා

**ආදර දුවේ පුතේ ඔබත් හොඳ දරුවන් වෙන්න.**
**ඔබට දෙවි මවු පිහිටයි !**

## කුරුල්ලා



උදෑසනම අවදි වෙලා - සිත් සතුටින් ගී ගයලා
ආකාසේ පියඹලා - සතුටින් ලොව සරලසාලා

**මෙන්නා රිත්මනී**
**4 ශ්‍රේණිය, ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය, මොරටුව**



## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - වී.ඒ. රශ්මි හිරන්

**ශ්‍රේණිය** - 3 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. මරියා දහම් පාසල මතුගම

**කුසලතා** - චිත්‍ර

## අපි වෙමු කිතුනු ළමුන්

ළමා ප්‍රදීපය

නම :- ..................................................................

ලිපිනය :- ..................................................................

පාසල :- ..................................................................

පංතිය :- ..................................................................

උපන් දිනය :- ...................... නිවසේ දු. අ. ..................

දහම් පාසල :- ..................................................................

මීසම :- ..................................................................

සහභාගි වන සමිති සමාගම් :- ....................................

කුසලතා දක්වන ක්ෂේත්‍රය :- ....................................

(කවි කෙටි කතා. චිත්‍ර වාර්තා, වෙනත් )

අපි වෙමු කිතුනු ළමුන් වැඩ සටහනට මා ද ඇතුළත් කර ගන්න.

.................................... ................................

අත්සන දිනය

**අපි වෙමු කිතුනු ළමුන් ළමා පාඨක එකමුතුවේ ලියාපදිංචි වීමට ඔබත් කැමති නම් ඉහත ළමා ප්‍රදීපය ලාංජනය සහිත පත්‍රිකා තුනක් එකතු කර අයැදුම් පත්‍රය පුරවා 2x2 ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපි වෙමු කිතුනු ළමුන්, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 ලිපිනයට තැපැල් කරන්න.**

## ප්‍රහේලිකා අංක 26



### හරහට

1. හෙබ්‍රෙව් ජනතාව දේව නමස්කාරය සඳහා උපයෝගී කරගත් ගීත බොහොමයක් අඩංගු ශු. බයිබලයේ ඇති පොතකි.
4. ප්‍රසාද නිධාන සංඛ්‍යාව
5. ක්‍රිස්තුන් වහන්සේ මල් උයනේ යාච්ඤා කළ පසු, තමන් වෙතට එන හේවායින් ඉදිරියට ගොස් "ඔබ සොයන්නේ කවරෙක්දැයි" ඇසූ සේක. මෙහි කවරෙක්ද යන පදයට සමාන වචනයකි.
7. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ මරණයට පත් වූයේ ලෝ..........ගේ පව් උදෙසාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.
9. ක්‍රිස්තුන් වහන්සේ මරණයේ ....................... බිඳ දමා දින තුනකින් උත්ථාන වූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.
10. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට පෙර මෙම පහරවල් වලට ලක් වූ සේක.

### පහළට

1. මේවා ගැසීම දෙවරක් යැදීමක් බව කියැවේ.
2. දෙවියන් වහන්සේට පමණක් මෙසේ කරන්නැයි දස පනතේ පළමු පනතින් අපට උගන්වයි.
3. ක්‍රිස්තුන් වහන්සේ "මම ................ බැටළු එඬේරා වෙමි." වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.
6. ක්‍රිස්තුන් වහන්සේ තුන් පැයක් කුරුස ගසේ .................. උකුත් වූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. හෙරෝදියස්ගේ දියණිය ස්නාවක ජුවාම් තුමාගේ මෙය තැටියක දමා රජතුමාගෙන් ඉල්ලූ බව ශු. බයිබලයේ සඳහන්වේ.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ජුවාම් 10, 18, ශු. මාක් 6 )

**නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 26, ළමා ප්‍රදීපය,අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණී දුතිකා පෙරේරා )**

**ප්‍රහේලිකා අංක 26 පිළිතුරු හා ප්‍රහේලිකා අංක 27 ලබන සතියේ පළ වේ.**

# ගැලවුම්කාර ජේසු

45 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා